(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 83.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

156/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වනාන්තරයන්හි නම් කවරේද;

(iii) එක් එක් වනාන්තරයන්හි විශාලත්වය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) උක්ත වනාන්තරයන්හි සීමා මායිම් ලකුණු කර තිබේද;

(ii) එසේ නම්, එම සීමා නිර්ණය කිරීම සිදු කරනු ලැබූ දිනය කවරේද;

(iii) නොඑසේ නම්, සීමා නිර්ණය කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ(ii)හි සඳහන් වනාන්තර තුළ මේ වනවිට නිවාස, සංචාරක හෝටල් හෝ වෙනත් ඉදිකිරීම් කර තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම් හේතුවෙන් වනාන්තරයට සිදු වන බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

420/'16

2.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා නිකුත් කරන ලද අත් පොතේ සඳහන් ආකාරයට, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල එක් එක් පාඨමාලා සඳහා, 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 වර්ෂවලදී බඳවා ගැනීමට නියමිත වූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වර්ෂවලදී ඉහත පාඨමාලා සඳහා සත්‍ය වශයෙන්ම බඳවාගත් සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් පාඨමාලා සඳහා නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් බඳවාගෙන ඇත්නම්, ඒ සඳහා හේතු කවරේද;

(iv) එක් එක් පාඨමාලා සඳහා නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් බඳවාගෙන ඇත්නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

441/'16

3.

ගරු ඩී. වී. චානක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් රුපියල් 50,000/= සහ රු. 100,000/= බැගින් වන නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) 2015 වර්ෂය සඳහා එම නිවාස ණය ලබාදුන් ණයලාභීන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අදාළ ණයලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ණය ලබාදීමේදී සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(v) ණය ලබාදීම සඳහා දේශපාලන පක්ෂ ශාඛා සමිතියක නිර්දේශය ඉල්ලා සිටින බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

460/'16

4.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ ජාතික පුනර්ජීවන වැඩසටහන අනුව, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබාදුන් රුපියල් 2000/=ක මාසික දීමනාව, නව රජය බලයට පත්වීමෙන් පසුවත් 2015 වර්ෂය පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබුවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේදී,

(i) එම දීමනාව ලබා දුන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සංඛ්‍යාව;

(ii) එම දීමනාව ලබාදීම සඳහා වැය වූ මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2016 වර්ෂය ආරම්භවීමත් සමඟ උක්ත රුපියල් 2000/= මාසික දීමනාව, රුපියල් 1900/= දක්වා අඩුකර ඇති බව පිළිගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

474/'16

5.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.01 දිනට සහ 2015.12.31 දිනට ශ්‍රී ලංකා රජයේ විදේශ ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015.01.01 දිනට සහ 2015.12.31 දිනට ඇමෙරිකානු ඩොලරය සහ ශ්‍රී ලංකා රුපියල අතර විනිමය අනුපාතය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වසර තුළ දී ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව, රුපියලේ අගය පිරිහීම හේතුවෙන්, 2015.12.31 දිනට පැවති ශ්‍රී ලංකාවේ විදේශ ණය ප්‍රමාණය රුපියල් කොපමණකින් ඉහළ ගොස් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

504/'16

6\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) Lanka Marine Services Ltd. (LMSL) සමාගමේ වත්කම් අක්‍රමික ලෙස විකිණීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SEFR209/2007 යටතේ ගොනුකර ඇති පෙත්සමට අදාළව ලබාදී ඇති නඩු තීන්දුවෙන් මතුකරනු ලැබූ කරුණු ගැන විමර්ශනයක් ආරම්භ කරන ලෙසට 2007.07.21 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝගකර තිබෙන බවත්;

(ii) එම විමර්ශන කටයුතු සිදුකර එහි උද්ධෘත නීති උපදෙස් සඳහා 2008.12.08 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත්, මෙතෙක් ඊට අදාළ උපදෙස් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම උපදෙස් ලබාගැනීමට පියවර ගන්නේද;

(ii) එම තොරතුරු කවරේද යන්න මෙම සභාවට දැනුම් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

513/'16

7\.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය අවුරුදු 15 තුළ දක්නට ලැබුණු අඩුම මිළට තේ සහ රබර් මිළ ගණන් පහත වැටී ඇති බවත්;

(ii) සමස්ත තේ අපනයනවලින් 80%ක් සපුරාලනු ලබන්නේ කුඩා තේ වතු හිමියන් විසින් බව සහ පසුගිය මාස 6 තුළ තේ අපනයනය තුළින් ලැබූ ඉපයීම් 21%කින් පහත වැටී ඇති බවත්;

(iii) නිෂ්පාදන ක්‍රියාවලිය තුළ අත්විඳින ලද අලාභ හේතුවෙන් සමහර කුඩා තේ වතුහිමියන් තේ නිෂ්පාදනය අතහැරදමා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පසුගිය මැතිවරණ ව්‍යාපාරය තුළදී පොරොන්දු වූ ආකාරයට අමු දළු කිලෝග්‍රෑම් එකක් සඳහා රු.90/-ක් සහ ෂීට් රබර් කිලෝග්‍රෑම් එකක් සඳහා රු.350/-ක් ගෙවීමට;

(ii) මෙම කර්මාන්ත ආරක්ෂාකර ගැනීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ඔවුන්ගේ ඉඩම් ඇපයට තබාගෙන හෙක්ටයාරයට රුපියල් මිලියනයක සහනදායී දිගුකාලීන ණය මුදලක් නාමික පොළියක් මත අවුරුදු 10න් ආපසු අයකර ගන්නා පදනමින් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමට රජය කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

560/'16

8\.

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වට්ටක්කච්චි ප්‍රදේශයේ රජයේ කෘෂිකාර්මික ගොවිපළක් සහ කෘෂිකාර්මික විද්‍යාලයක් පිහිටා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගොවිපළෙහි විශාලත්වය කොපමණද; ගොඩ ඉඩම් හා මඩ ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

(iii) මේ වනවිට එම ගොවිපළ පාලනය කරන්නේ කවුරුන් විසින්ද; එය පරිහරණය කරන්නේ කවුරුන්ද;

(iv) අදාළ දෙපාර්තමේන්තුව යටතට එම ගොවිපොළ පවරා දෙන්නේද;

(v) නැවතත් එහි කම්කරුවන්ට රැකියා අවස්ථා ලබාදී එය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වට්ටක්කච්චි කෘෂිකාර්මික ගොවිපොළ සමඟ ඇති කෘෂිකාර්මික විද්‍යාලය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(ii) වවුනියාව සහ කුණ්ඩසාලේ ඇති කෘෂි විද්‍යාලවලට සමාන අයුරින් මෙය ක්‍රියාත්මක වූ බව එතුමා දන්නේද;

(iii) යළිත් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නේද;

(iv) එය අදාළ දෙපාර්තමේන්තුවට පවරා දී ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

576/'16

9\.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම, කල්පිටිය, සින්නකුඩියිරුප්පුව, ආනවාසර් පාර ලිපිනයේ පදිංචි එම්.එච්.එම්. සාලි මහතාට අයත් කල්පිටිය, බසාර් වීදියේ පිහිටි, "මවුලානා ටෙක්ස්ටයිල්ස්" වෙළඳ ආයතනය 2002.02.21 දින දාමරිකයින් පිරිසක් විසින් ගිනිතබා විනාශයට පත් කරන ලද බවත්;

(ii) ව්‍යාපාරය අහිමි වී අසරණභාවයට පත්ව සිටින සාලි මහතා විසින් තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුරුත්ථාපනය කිරීමේ අධිකාරිය වෙත වන්දි අපේක්ෂාවෙන් අංක REP/PV/APP/2002 යටතේ අයදුම්පත්‍රයක් යොමු කරනු ලැබුවද ඔහුට මේ දක්වාත් වන්දි ප්‍රදානය කිරීමක් සිදුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වසර ගණනාවක කාලය තුළ නොයෙකුත් හේතු කාරණා ඉදිරිපත් කරමින්, එම අයදුම්පත් සම්බන්ධයෙන් කල්මැරීමේ ප්‍රවණතාවයක් තිබෙන හෙයින්, මේ සම්බන්ධයෙන් සොයා බලා සාලි මහතාට හිමි වන්දි මුදල නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

580/'16

10\.

ගරු වමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වසරේ ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරු රජයේ වියදමින් විදේශ සංචාරයක් සඳහා සහභාගි වී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ජනාධිපතිවරයා අනුමතිය ලබාදී තිබේද;

(iii) ඒ සඳහා වැයකර ඇති මුළු මුදල කොපමණද;

(iv) මෙම චාරිකාවේ අරමුණ කවරේද;

(v) පළාත් සභා මන්ත්‍රීවරුන්ට අමතරව, වෙනත් පුද්ගලයින් පළාත් සභාවේ වියදමින් මෙම විදේශ සංචාරය සඳහා සහභාගි වී තිබේද;

(vi) එසේ නම්, එම පුද්ගලයින්ගේ නම් හා තනතුරු කවරේද;

(vii) පවතින නීති රීති අනුව රජයේ වියදමින් එම පුද්ගලයින්ට සහභාගි විය හැකිද;

(viii) රජයේ සේවයෙන් නිවාඩු ලබාගෙන සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කරන පුද්ගලයෙකුට රජයේ වියදමින් විදේශ ගමන් සඳහා සහභාගි විය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

594/'16

11\.

ගරු ලකී ජයවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී සතොස මඟින් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද; ඒ සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) එම සහල් ප්‍රමාණයෙන් මේ වනවිට අළෙවි කර ඇති ප්‍රමාණය කොපමණද; එමඟින් සතොස ලබා ඇති ලාභය කොපමණද;

(iii) අළෙවි කිරීමට නොහැකි වූ සහල් ප්‍රමාණය කොපමණද; එමඟින් සතොසට සිදු වූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි අලාභයන් සිදුවන්නේ සහල් ආනයනයට පෙර දේශීය වෙළඳපොළ තත්ත්වය සැලකිල්ලට ගෙන කටයුතු නොකිරීම නිසා බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පාඩු ලබන ක්‍රියාවන් එළදායී අන්දමින් සිදු කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද; එය ක්‍රියාවට නංවන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

606/'16

12\.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා,

(i) රජයේ මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් සහභාගි වී ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) අග්‍රාමාත්‍යවරයාද ඇතුළත්ව එම සංචාර සඳහා සහභාගී වී ඇති මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් කවුරුන්ද;

(iii) සංචාරය කරන ලද රටවල් කවරේද;

(iv) එම විදේශ සංචාරවලින් රාජකාරි හා පෞද්ගලික සංචාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අ (i) හි සඳහන් සංචාරයන් සඳහා රජයේ නිලධාරීන් සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත කාලසීමාව තුළ රජයේ මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් සහභාගී වී ඇති විදේශ සංචාරවලට වැය වී ඇති මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

614/'16

13.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ - අනුරාධපුර ප්‍රධාන මාර්ගයේ, ගලේවෙල නගරයෙන් වමට හැරී, කලාවැව වැව් බැම්ම හරහා, ඉහළගම හන්දිය පසුකර, තෝනිගල හන්දියෙන් A-9 ප්‍රධාන පාරට සම්බන්ධ වන මාර්ගය අවුරුදු 50කින් ප්‍රතිසංස්කරණයකර නොමැති බවත්;

(ii) මෙම මාර්ගය ඔස්සේ, ගලේවෙල සිට A-9 මාර්ගයට සම්බන්ධ වීමෙන් යාපනය සහ වවුනියාව යන නගරවලට පහසුවෙන් ලඟා විය හැකි බවත්,

(iii) එමඟින් ආර්ථික වාසි මෙන්ම, ප්‍රධාන මාර්ගයේ වාහන තදබදයද අවම වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මහවැලි ප්‍රදේශයේ ජනතාවට පහසුකම් සැලසෙන කි.මී. 46ක් වන මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතුව කවරේද;

(ii) එම මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය රජයෙන් ප්‍රතිසංස්කරණය ආරම්භ කර මේ වනවිට වැඩ නවතා ඇති කැකිරාව නගරයේ සිට ගනේවල්පොල දක්වා වූ කි.මී. 07ක මාර්ගයෙහි වැඩ කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

617/'16

14.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි තිරුක්කේදීස්වර කෝවිල හින්දු ජනතාවගේ ශුද්ධ වූ පූජනීය ස්ථානයක් බවත්;

(ii) තිරුක්කේදීස්වර කෝවිලට ඉතා ආසන්නව පිහිටි කනපතිපිල්ලෙ විජයකුමාර් මහතාට අයත් ඉඩමෙහි නීතිවිරෝධී ලෙස බෞද්ධ විහාරයක් ඉදිකරමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නීතිවිරෝධීව ඉදිකරන මෙම විහාරයේ ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 18 දිනැති අංක 1954/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන

ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*9.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 1),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 2),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වැනි වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ රීති,— 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලදුව, 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.23 දින ඉදිරිපත් කරන ලද 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති සහ 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමේ) රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**